නිපුනතා මට්ටම 9.7 - ඇල්ගෝරිතම ආකේතනය කිරීම සඳහා විධානාත්මක ක්‍රමලේඛ භාෂාවක් භාවිතා කරයි..

1. පයිතන් ක්‍රමලේඛයක ව්‍යුහය

   පයිතන් ක්‍රමලේඛයක් එම භාෂාවේ කාරක රීති වලට අනුකූලව සකස් කල ප්‍රකාශයන්ගේ එකතුවක් ලෙස දැක්විය හැක.

   a. පයිතන් ප්‍රකාශ ආකාර දෙකකට බෙදා දක්වයි.ඒවා නම් කරන්න.

2. පයිතන් ක්‍රමලේඛයකට උදාහරණයක් පහත දැක්වේ.

```
#Examples.py
#First Example
While True
        X=input ("enter a string :")
        char_count=len(x) #compute the length
        Print ("string",x, length:",char_count)
```

   a. මෙම ක්‍රමලේඛයේ පළමු පේලි 3 හා දෙවන පේලි 3 වෙන් වෙන්ව එකම රටාවකට කාරක රීති වලට අනුව අනුඡේදනය(Indent) කර ඇත.එසේ කිරීමෙන් ක්‍රමලේඛකයෙකුට ලැබෙන වාසියක් නම් කරන්න.

3.
   a. ක්‍රමලේඛයකදී විවරණ(comments) යොදා ගන්නේ කුමක් සඳහාද?
   b. පයිතක් ක්‍රමලේඛයකදී විවරණ ආරම්භ කිරීමට යොදා ගන්නා සංකේතය කුමක්ද?
   c. ඉහත දී ඇති පයිතන් ක්‍රමලේඛයේ සඳහන් වී ඇති විවරණ ලියා දක්වන්න.

4. විචල්‍ය(Variables) හා නියත(Constant) යනු මොනවාදැයි කෙටියෙන් හඳුන්වන්න.
5. කලින් නිර්වචනය කල ලක්ෂණ හා මෙහෙයවන සහිත අගයන් සමූහයක් දත්ත ප්‍රරූපයක්(Data Type) ලෙස හඳුන්වයි.දත්ත භාවිතයට පෙර ඒවායෙහි ප්‍රරූප දැන ගත යුතුය.
   a. පයිතන් භාෂාවේ හඳුන්වා දී ඇති ප්‍රධාන දත්ත ප්‍රරූප මොනවාද?
6. මෙහෙයවන(Operators) මගින්,දත්තයක් මත කල යුතු ක්‍රියාවන් නිරූපණය කරයි.පයිතන් භාෂාවේ ඇති ප්‍රධාන මෙහෙයවනයන් කාණ්ඩ 4කට බෙදා දක්වන්න..
7. පයිතන් භාෂාවේ මෙහෙයවන වල ප්‍රමුඛතාවය(Operator Precedence) අඩු ප්‍රමුඛතාවයේ සිට වැඩි ප්‍රමුඛතාවය දක්වා වෙනස් වන ආකාරය ලියා දක්වන්න.